නුවනත විද්‍යුත් සිංහල සඟරාව
වෙළුම 01, 2022, 121 - 127

සිංහල අධ්‍යයනාංශය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය
රුහුණ විශ්වවිද්‍යාලය

# "වන්නි බණ්ඩාර දේව සංකල්පය" (කුංචුට්ටු කෝරළය ඇසුරෙන්)

## ජනශ්‍රැතිය හැඳින්වීම

ජනශ්‍රැතිය ගැඹුරු අර්ථයක් දක්වන පුළුල් ක්ෂේත්‍රයකි. සාමාන්‍ය ජනතාව ජනශ්‍රැතිය රස විඳින්නන් මිස විශේෂඥයෝ නොවෙති. මෙහි දී පළමු ව ජනශ්‍රැතිය සැකසී ඇති අයුරු බැලූ විට කොටස් දෙකක් දැකිය හැකි ය. එනම් "ජන" හා "ශ්‍රැති" වශයෙනි. 'ජන' යනු කිසියම් ජන කොට්ඨාසයක් නැතහොත් ජන සමූහයක් ලෙස අර්ථ දැක්විය හැකි ය. පුද්ගලයන් කිහිප දෙනෙකුගේ හෝ රාශියකින් සමන්විත ඒකකය සමාජය යි. ජනශ්‍රැතිවල අත්‍යවශ්‍ය සාධකය වන්නේ ජනතාව යි. ජනතාවගෙන් තොර ව ජනශ්‍රැතිය නොපවත්නා බව මින් අපට අවධාරණය කෙරෙයි. 'ශ්‍රැති' යනු අසන දෙය නැතහොත් මුඛ පරම්පරාගත ව පැවත එන දෙයකි. ජනශ්‍රැතිය සරල වදනක් ලෙස පෙනී ගිය ද එහි යථාර්ථය එයට හාත්පසින් ම වෙනස් වූවකි. 'ජනශ්‍රැතිය' යන වචනය *Popular antiquities - Popular literature* යන පද දෙක වෙනුවට *Folklore* යන යෙදුම බ්‍රිතාන්‍ය ජාතික විලියම් තෝමස් ප්‍රථමයෙන් භාවිත කර තිබේ. විශ්වාස, ඇදහිලි, අභිචාර විධි, චාරිත්‍ර - වාරිත්‍ර, ජන ක්‍රීඩා, ජන බස, යාතුකර්ම, වෘක්ෂශ්‍රැති, සත්ත්වශ්‍රැති, ප්‍රස්තාව පිරුළු යනාදි විවිධාකාර අංග ජනශ්‍රැතියෙහි අන්තර්ගත වේ.

## දේව සංකල්පය පිළිබඳ හැඳින්වීම

ආදියේ සිට ගහකොළ දේවත්වයෙහි ලා සැලකීම හෙළ සිරිත ය. ගස්වලට අධිගෘහිත දේවතාවුන් වැඩ සිටින බව ඇදහූ හෙයින් ගස් වන්දනාව සිදු විය. වනයට ඇතුළු වන විට ගසක අත්තක් කඩා එල්ලා අවසර හා ආරක්ෂාව පැතීම සිරිතකි. මෙම ආරක්ෂා කර දෙන දෙවියන් 'වන්නියේ බණ්ඩාර දෙවියන්' ලෙස හඳුන්වනු ලැබිණි. වන්නියේ දෙවියන්ට සහෝදරයන් සය දෙනකු සිටි බවත් දිනක් මී කැඩීමට යන මොවුන්ට මීයක් මුණගැසී කොටා වන්නි දෙවි නොමැති හෙයින් ඔහුට අයත් කොටස බෝල්පනා ගසක එල්ලා සහෝදරයෝ (එනම් කතරගම දෙවියෝ, පුල්ලෙයාර දෙවියෝ, විෂ්ණු දෙවියෝ, වැවේ බණ්ඩාර දෙවියෝ, කැලේ බණ්ඩාර දෙවියෝ, කඩවර දෙවියෝ, හනුමන්ත දෙවියෝ) අනුභව කරන්නට වූහ. වන්නි දෙවියන් ඔහුගේ කොටස විමසූ විට සහෝදරවරු කළ ක්‍රියාපාටිපාටිය පැහැදිලි කර, පසු ව දෙවියන් විසින් ඔවුන්ගෙන් ඈත් ව වනගත ව හුදෙකලාව ජීවත් වීමට තීරණය කරන ලදි. ඔහු කැලයට අධිපති දෙවි ලෙස එතැන් සිට වන්දනයට පාත්‍ර විය. කුංචුට්ටු කෝරළයේ ජනයා අතුරෙන් බොහෝ දුරට ඉවත් ව ගිය ප්‍රාදේශීය දෙවිවරුන් අතර අතීතයේ වැදගත් ස්ථානයක් හිමි කර ගත් දෙවි කෙනෙකු වශයෙන් මෙම දෙවියන් හැඳින්විය හැකි ය. වර්තමානයේ දී ඇතැම් මිනිසුන් ශ්‍රද්ධා භක්ති පූර්වක ව මෙම දේව සංකල්පය ඇදහීම සිදු කරයි. කැබිතිගොල්ලෑවට බටහිර දෙසින් වව්නියාව දක්වා දිවෙන කුංචුට්ටු මහා වනාන්තරයෙන් ද, නැගෙනහිර දෙසින් ඇති මුලතිව් ඝන වනාන්තරයෙන් ද, දකුණින් හොරොව්පතාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ද, උතුරින් මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ද සීමා මායිම් කරගත් ගැමියන් අතර පවතින විශ්වාසය නම් එම

දෙවියන් මයිල ගසක් හෝ සියඹලා ගසක් ආශ්‍රිත ව වෙසෙන බව යි. වන්නියේ බණ්ඩාර දෙවියන්ගෙන් පිහිට ආරක්ෂාව කුංචුට්ටු කෝරළේ වැසියෝ නිරන්තරයෙන් බලාපොරොත්තු වෙති. අලින් ඇතුළු වල් සතුන්ගෙන් පැමිණෙන උවදුරු වළකාලීමට ද මෙම දෙවියන්ගෙන් පිහිට පතනු ලැබේ. හේන් වපුරා අවසානයේ මයිල ගසක් හෝ සියඹලා ගසක් මුල් කරගෙන කිරි උතුරවා දෙවියන්ගෙන් පිහිට ප්‍රාර්ථනා කෙරේ. මී කැඩීමට යාමට පෙර ද දෙවියන් සිහි කොට තම කාර්යයේ නිරත වී තිබේ. බුවනෙකබාහු රජු විසින් වන්නි බණ්ඩාර හට පිරිනැමූ සන්නසට අනුව කැලේට අධිපති වූයේ ද වන්නි බණ්ඩාර දෙවියන් ය. මේ සියල්ලෙන් ධ්වනිත කරනු ලබන්නේ හෙළයා විසින් ජීවියාගේ පැවැත්මට මෙන් ම ස්වභාව ධර්මයේ අත්‍යාවශ්‍ය නිර්මාණයක් ලෙස පරිසරය සුරැකීමෙහි ලා ගස විසින් ඉටු කරනු ලබන මහා මෙහෙවර නිවැරදි ව අවබෝධ කොට ගෙන ඊට දේවත්වය ආරූඪ කිරීම විය හැකි ය. වන්නියේ බණ්ඩාර දෙවි උදෙසා කළ යුතු වත්පිළිවෙත් නිසි ආකාරයෙන් සිදු කළ යුතු ය. එසේ නොකළහොත් දඬුවම් ක්‍රම ද පැමිණෙන බව ගම්මුන්ගේ මතය යි.

## දේව සංකල්පයේ උපත

වන්නියේ බණ්ඩාර දෙවියන්ගේ උප්පත්තිය පිළිබඳ සඳහන් කරන්නේ නම් එම දෙවි වියලුවේ ගබඩා ගමේ උපන්නෙකි. ඔහු උපන් ස්ථානය හුණු කැටේ ගෙදර නම් විය.

"උපන් ගමයි වියලුවේ ගබඩා ගම
බලපෑමට ලෝකේ සැම තැනට ම
නමින් උතුම් හුණු කැටේ ගෙදර ගම
වන්නියේ බණ්ඩාර ඔන්න කතර ගම" (ධර්මදාස කේ.එන්.ඕ සහ තුන්දෙනිය එච්.එම්.එස්, පි. 396).

කතරගමට ගොස් යක් බවට පැමිණ ඇතෙකු පිට නැගී උඩරටට පැමිණියේ ය. මේ ගමනේ දී දංකොටුව, ගල්කොටුව, ගුරුබද්ද, ආදිරබ්බ, කටුපත්වෙළ, හබ්බිලිය, හකුරුතලේ, හෝමාගම, සිඟුරුවඩුව ආදි ස්ථානවලට පැමිණ තිබේ. වන්නියේ දෙවි රජ්ජුරුවෝ යන නාමයෙන් ද "වන්නි බණ්ඩාර දෙවි" නාමයෙන් ද උනුවින්න වාසය ප්‍රිය කළ හෙයින් "උනුවින්නේ බණ්ඩාර" නමින් ද හඳුන්වා ඇත. හෙන්රි පාකර් ගේ මතය වන්නේ මොහු "අයියනායක" "බිළිඳු බණ්ඩාර" යන නම්වලින් ද හඳුන්වා ඇති බව යි. කතරගම, විෂ්ණු, සමන්, පත්තිනි යන දේව ධුරාවලිය පුද ලබන ප්‍රදේශීය දෙවි කෙෙනකු ලෙස වන්නි බණ්ඩාර දෙවි ගෙනහැර දැක්විය හැකි ය.

මහා විෂ්ණු ස්ත්‍රී වේශයක් ගෙන ඔන්චිල්ලා පදිමින් සිටියේ ය. ඊශ්වරගේ භාර්යාව ස්නානය කරමින් සිටින ආකාරය දෙස බැලීමට යැවූ කේලම්කරු බලා සිටින ආකාරය දුටු ඊශ්වර ඇතු පිට නැග කුමරුට කඩුවෙන් කොටා ගෙල සිඳ දැම්මේ ය. ඔහු පසුපස ආ කේලාම්කරුගෙන් කුමක් කරන්නේ දැයි විමසූ විට සියලු පුවත් කීවේ ය. පසු ව ඊශ්වර හා උමයංගනාව කැමැත්ත ප්‍රකාශ කොට උපන් රාගය නිසා ඊශ්වර ඔන්චිල්ලාවෙන් මෑත් ව සුරංගනාව තුරුලට ගත්තා ය. ඒ මොහොතේ කේලාම්කරු වූ බස්මාසුර ඇයගේ කුස පිළිසිඳ දස මසක් ඇවෑමෙන් තම දකුණත පලා එතනින් උපදවා ගත්තී ය. එසේ උපන් කුමරු "අයියනායක බණ්ඩාර" හෙවත් වන්නි බණ්ඩාර නම් වූ බව පාකර් තවදුරටත් පවසයි. මුඛ පරම්පරාගත තොරතුරු ද මෙයට දෙස් දෙයි.

9 772950 655005

## සිරිත් විරිත් හා අභිචාර විධි

තමා ජීවත් වන පරිසරයට ආදරය කිරීම, ගෞරව කිරීම සරල දිවි පෙවතක් ඇති මිනිස් සමාජවල පොදු ලක්ෂණයකි. මෙම සිරිත් විරිත් හා අභිචාර විධි පහසුවෙන් අවබෝධ කරගැනීම සඳහා පහත ආකාරයට මෙසේ පෙළ ගැස්විය හැකි ය.

### 01. මුඩප්පු බැඳීම

මහා කැලේ යාමට ප්‍රථමයෙන් කරන්නේ මෙම චාරිත්‍රය යි. කහ දියරෙන් නාවා ගත් පුවක් ගෙඩියක් සුදු රෙදි කඩක ඔතා වහලයේ හෝ ගෙයි ඉදිරිපස ගසක බැඳීම මෙහි දී සිදු කෙරේ. දෙවියන්ගෙන් එහි දී රැකවල ලබා දෙන ලෙසත් දඩමස්, මී පැණි ආදි සම්පත් නොඅඩු ව ලබා දෙන ලෙසත් අයදියි. මේ කාර්‍යය කැලේ ව්‍යවහාරයේ දී "කානාකාරිය" නමින් භාවිත වේ.

### 02. පොල් උඩ තැබීම

කැලේ යාමට ප්‍රථමයෙන් ඇතැම් මිනිස්සු ලෙලි සහිත පොල් ගෙඩියක් හා දියරයෙන් ගස් දෙබලක් මත තැබීම සිදු කරති. කහ දියරයෙන් නැහැ වූ පසු හුනු තැවරීම ද සිදු වේ.

### 03. හාල් උඩ තැබීම

මෙය ද මහා කැලේ යාමට පෙර කුංචුට්ටු කෝරළයේ ඇතැම් ගම් ප්‍රදේශයක සිදු වෙයි. කැකුළු හාල් නැළියක් පමණ ගෙන සුදු රෙදි කඩක ඔතා වහලයේ එල්ලා තබන අතර, ගමන නිමවා පැමිණි පසු එම හාල් ගෙන කිරි උතුරවා දෙවියන් පිදීම ගම්වැසියන්ගේ සිරිත යි.

### 04. අතු කඩා එල්ලීම

නියමිත දිනයේ දී අසුබ නිමිති මඟ හැර අලුයමින් පිටත් වන පිරිසෙහි නායකයා "රාල" වනයට ඇතුළු වීමේ දී වන්නියේ බණ්ඩාර දෙවියන් උදෙසා බෝල් පණා අතක් කඩා එල්ලා යාම සිරිතකි. මෙම සිරිත අනාදිමත් කාලයක සිට පැවත එන්නකි. දඩයම් කිරීමට සහ මී කැඩීමට යන පිරිස මේ සිරිත අනුගමනය කර ඇත.

### 05. ඉහකඩ පූජාව

මීයක් කඩා ගැනීමෙන් පසු මුලින් ම ඉටු කරන්නේ වන්නියේ දෙවියන් වෙනුවෙන් ඉහකඩ පූජාවක් පැවැත්වීම යි. මීය වඩුවා ගත් ස්ථානයේ ම "මුක්කාලියක්" බැඳ තට්ටුවෙහි බෝල් පනා පත් අතුරා ඒ මත පැණි කැට තබා තව තවත් ගබඩා ලැබෙන සේ ඉල්ලයි. මේ සඳහා මුල් වන්නේ කණ්ඩායම් නායකයා ය.

9 772950 655005

### 06. නිවසෙහි වත්පිළිවෙත් (පෙහෙවස්) වීම

පෙහෙවස්, පේවස් යන ද්විත්ව රූපයන්ගේ අදහස ඉර අවරට හැරුණු පසු ආහාර නොගෙන සිටීම හෝ අටසිල් රැකීම යි. උවදුරුවලින් ගහන වූ වනයෙහි ජීවත් වන සිය ස්වාමියාගේ ජීවිතය ආරක්ෂා කර දීමේ වගකීම බිරිඳට පැවරෙයි. නිවසෙන් පිට වීමේ දී නිවසේ කිසිවෙකු ස්නානය නොකරයි. පොල් බිඳීම සිදු නොකරන අතර ශබ්ද නගා කහ තැලීම සිදු නොකර සිටීමට ද කටයුතු කරයි. නිවසට යම් හිතවතෙකු පැමිණියහොත් කිසිවෙකුටත් සංග්‍රහ නොකරයි. පිටි කෙටීම, කලකෝලාහල කිරීම, කොක් හඬලා සිනාසීම, කැවුම් කිරිබත් ඉවීම, පුළුටු වර්ග පිසීම, ආප්ප පිච්චීම ආදියෙන් වැළකී සිටිය යුතු ය. මේවායින් වැළකී සැමියා පිළිබඳ නිරතුරු ව සිහිපත් කළ යුතු ය. පෙහෙවස් නොරැකි, රිසි සේ හැසිරීමෙන් 'අවයක්' සිදු වේ. එහි දී ඔහුට බලාපොරොත්තු වූ පරිදි 'රස්සාව' නොලැබී යාම, මං මුළා වීම, සතුන්ගේ කරදරවලට ලක්වීම ද සිදු වේ. මෙමගින් වන්නි දෙවි සතු තේජෝ බල පරාක්‍රමය ඉස්මතු වේ.

### 07. බෝල බැඳීම

ස්වකීය ගම් සීමාවෙන් පිට ගමකට අයිති කැලෑවකින් හේනක් කෙටීම නීති විරෝධී ය. එය නතර කිරීම අරමුණු කොට බෝල බඳිනු ලැබේ. එනම් බෝල් පනා අතු මිටියක් ගෙන අගිස් පහළට සිටින සේ මිනිස් උසින් ගත් ලීයක කෙළවරෙහි බැඳ මායිම් සිටුවීම යි.

### 08. හේන් ගෙවඩීම.

කැපීමට සූදානම් පඳුරට තෙවරක් නමස්කාර කිරීමෙන් අනතුරු ව කැලේ බණ්ඩාර දෙවියන් සිහි කොට, තුන් වරක් පඳුර වටා පැදකුණු කොට පළමු කැති පහර හෙළීම හේන් ගෙවඩීම යි. හේන් ඇල්ලීම යන්නෙන් අදහස් වන්නේ ද හේන් ගෙවඩීම යි.

## සංස්කෘතික වටිනාකම

වන්නි බණ්ඩාර දේව සංකල්පය වටා ගොඩ නැඟී ඇති උත්සව, දේව මංගල්‍යය, කිරි ඉතුරුම් මංගල්‍යය ආදි වශයෙන් සංස්කෘතික අගය විදහා දැක්විය හැකි ය.

## කිරි ඉතුරුම් මංගල්‍යය

මහා කැලේ ගමනට පෙර දා හොඳින් ස්නානය කොට පිරිසිදු වී ගමේ "සංහිඳ" සමීපයේ නුග ගසක් හෝ මයිල ගසක් පූජා භූමිය කර ගෙන කිරි ඉතිරීම සිදු කරයි. හාල්, මී තෙල්, බුලත්, පුවක් සහ දුම්මල, කපුරු, පූජා ද්‍රව්‍ය ගෙන නියමිත ස්ථානයට ගොස් ගොක් අතුවලින් කතිරයක් සේ පහන් පැලක් සාදා ගනියි. මෙම ස්ථානයෙහි කහ දියර ඉසීම ද අනිවාර්යයෙන් සිදු කෙරේ. පිරිසිදු බව පතා එය සිදුවන්නෙකි. මුක්කාලියෙහි (කණු තුනක් කපා පිරිසිදු කොට කතිරයක් සේ බැඳ ඒ මත ගොක් අතුවලින් පැලක් සෑදීම මුක්කාලිය යි.) තට්ටුව මත බුලත් කොළ එලා පිස ගත් කිරිබත් එහි තැන්පත් කෙරේ. බුලත්, පුවක් ආදිය ද පූජාසනය මත තබා කපුරු දල්වා දෙවියන්ට නමස්කාර කෙරේ. ඉන්පසු

9 772950 655005

පහන් වැටි තුනක් ගෙන එකක් ඍජු ව කොටුව මත තබා පූජාසනය ඉදිරිපස තැන්පත් කරනු ලැබේ. දැල්වූ පහන් තිර නිවී යන්නට පෙර යළි කහ දියර ඉස දොහොත් මුදුන් තබා වැඳ කපුරාල විසින් "කානාකාරිය" කියනු ලබන අතර සෙසු පිරිස ද දොහොත් මුදුන් තබා නමස්කාරය කියමින් ඊට සම්බන්ධ වීම සිරිත ය.

"ඕං වන්නියේ බණ්ඩාර දෙවියන් වහන්සේ, තමුන්නාන්සේ අඩුක්කු මංගල්ලය ඔප්පු කරගන්න ඕනැ ය. නෑ මේ භෝජන සංග්‍රහය පිළිගන්ඩ අපි තමුන්නාන්සේට ආරාධනා කරනවා. වන්නිය බණ්ඩාර අපිට 'රජමහ ගබඩාව' හැප්පෙණ්ඩ ඕනැ ය. වලහෙක් හැප්පෙණ්ඩ එපා ය. අපිට ජීවත් වෙන්න රස්සාව හැපෙන්ඩ ඕනෑ ය."

(නෙවිල් හ්‍යු, 1887, පි. 17-18).

"(විජේරත්න මල්හාමිගේ, වයස - 70, අටපාස්, නාවගස්වැව 7කණුව, මහසෙන්පුර. (මුල් පදිංචිය කච්චකොඩිය)

මෙහි 'රජ මහ ගබඩාව' ගැමියන්ගේ පිළිගැනීමට අනුව සුවිශේෂී මීයකි. 'අං' යනුවෙන් අදහස් කරන්නේ ගෝනුන් මුවන් වැනි අං සහිත සතුන් ය. 'රස්සාව' යනුවෙන් කියැවෙන්නේ වන ගමනේ දී අපේක්ෂා කරන සම්පත්තියත් ය. මහ කැලේ ගොස් එහි දී ද කිරි ඉතිරීමක් සිදු කරයි. ඒ සඳහා අවශ්‍ය ආම්පන්න එනම් හැන්ද, භාජනය, මුට්ටිය රැගෙන යනු ලැබේ. මේ සඳහා ගෙන යනු ලබන පන්මල්ල 'කිරි ඉතිරීමේ මල්ල" වේ. ඒ සඳහා රැගෙන යනු ලබන්නේ උක්දඬු, පලතුරු වර්ග කිහිපයක්, පොල් ගෙඩියක්, අමු අන්නාසි ගෙඩියක්, අමු කෙසෙල් ඇවරියක් ද වේ. අමු පලතුරු ඉදෙන්නා සේ මහා කැලේ ගිය ඇත්තන්ගේ අපේක්ෂා සපුරා ගැනීමට ඉඩ ලැබේවා'යි ප්‍රාර්ථනයෙන් මෙම පලතුරු එක්කොට ඇත.

කුංචුට්ටු කෝරළේ වැසියන් අතර මහ කැලේ ගොස් එන ගමනේ දී වනයෙන් පිටතට පැමිණීමට පෙර වතුර කඩක් අබියස දී තවත් වරක් කිරි උතුරයි. පෙර සඳහන් පරිදි ම 'මුක්කාලිය' බැඳ කිරි උතුර වන අතර කිහිප දෙනෙකු යළි වන වැදී 'කිරි ඉතුරුම් මීය' නම් විශේෂ මීයක් සොයා ගනු ලැබේ. මේ රැගෙන එන්නේ ගසේ පොත්තක ය. එය වන්නිය දෙවි අනුහසින් නිසැකයෙන් ම ලැබෙන බව ඔවුන්ගේ පිළිගැනීම යි. කිරි ඉතුරුම් මීය වඩුලාගෙන අවුත් ලිප මත ඇති කිරි උතුරන මුට්ටියට දැමීම සිරිත යි. ඉන් පසු ව වෙනත් අවස්ථාවල දී මෙන් දේව පූජා පවත්වා නියමිත චත්සිරිත් ඉටු කොට කිරිබත් බෙදා හදා අනුභව කෙරෙයි.

## වන්නි බණ්ඩාර දේව සංකල්පය වටා ගොඩ නැඟී ඇති ජනකවි, ජනකතා, කෝල්මුර

ජන කවි යටතේ මුබ බැඳීම, සතර බුද්ධාන්තරයෙන් වනාන්තරයේ මුබ බැඳීම, කටුවල, මීයක් හොරා කැඩූ එකෙකුට, මොර පාරේ යාම යනාදි ගෙනහැර දැක්විය හැකි ය. ජනශ්‍රැති වින්දනය උදෙසා කිහිපයක් මෙසේ දැක්විය හැකි ය.

## මුබ බැඳීම

"මරු කොළ රත්තරන් මේ රට බෝ වෙණ්ඩ
එම කොළ දාපු අත්තේ අළු එක් වෙණ්ඩ
මහා පෙත්මංවල පූජා අල්ලණ්ඩ

කළු දෙවි හඩන් උළලේනා නාඩණ්ඩ'' (වන්දන හිමි ඔරුක්මාන්කුලමේ, 1990, පි.164).

''ඉර බැද්දෙන් ඉර පහළට නොබසිණ්ඩ
සඳ පැත්තෙන් සඳ පහළට නොබසිණ්ඩ
ගඟ බැද්දෙන් ගඟ පහළට නොබසිණ්ඩ
මුඹ බැද්දෙන් උළලේනා නාඩණ්ඩ ''(වන්දන හිමි ඔරුක්මාන්කුලමේ, 1990, පි.164).

## කටු වල

''සිලිං ගන්නෙ ගල් කැට බොරලු
සිලිං ගාන්නෙ දැතේ වළලු
වළහා මීය කන ලෙසට ඇහෙයිලු
මෙවැනි කතෙක් කටුවල හාරහිලු'' (ධම්මානන්ද වත්තේවැවේ, 2013, පි. 194).

මෙම දේව සංකල්පය යටතේ ගොඩ නැඟී ඇති ජන කතාවක් ද මෙසේ දැක්විය හැකි ය.

**වලස් පුතා ගහ උඩ සිට, අම්මාගෙන් හපන්කම් බලයි**

වලසා නිතර ම මිනිසාට සතුරුකම් කරයි. මිනිස් කුයිලක් වලසාට දැනීම ප්‍රමාණවත් ය. මහ වනයේ දී මිනිසාට හුඟක් ම හතුරුකම් සිදු වන්නේ වලසාගෙනි. වලසා මිනිසුන් මරන්නෙ උවමනාවට නොවේ. වලසුන් මළ සිරුරු ආහාරයට නොගනී. එය වලසුන්ගේ පුරුද්දකි. මිනිස් වලස් පොරයක් පිළිබඳ පුවතක් පහතින් දැක්වේ.

වුට්ටා වව්නියාවේ සිට පදිංචියට ගියේ හේන් ගොවිතැන් කිරීම සඳහා ය. ගොවිතැනට අමතර ව වන්නියේ පුද්ගලයන් සිදු කරන තවත් කාර්යයක් වන්නේ මී පැණි කාලවල දී මී පැණි එකතු කිරීමෙන් මුදල් හම්බ කිරීම යි. දිනක් වුට්ටා තම සහෝදර ධර්මේ සමඟ මී පැණි එකතු කිරීමේ අදහසින් මහ වනයට රිංගා ගත්තේ ය. ගස්වැල්, වනසතුන් ගහන වනය හරිම හිතුවක්කාර යි. ඔවුන් දෙදෙනා සතු ව ඇත්තේ එක පොරව යි. "අයියා අර පැත්ත බලාගෙන උඩහට එන්ඩ. මං මේ පැත්තෙන් එන්නම්" ධර්මේ කීවේ ය. ඔවුන් දෙදෙනා සමග බල්ලන් දෙදෙනාත් වුට්ටා පසුපස ය. මඳ වේලාවක් පසු විය. වුට්ටා ගස් ගොම්මනක මීයක් සොයයි. වුට්ටා පිටිපස්සෙන් ආ දැවැන්ත වැළහින්න ඔහුගේ කකුලක මස් කුට්ටියක් කඩා ගත්තා ය. වුට්ටා බිම වැටුණේ ය. වුට්ටාගේ බල්ලෝ දෙදෙනා වැළහින්නගේ පැටියාට කඩා පැන්නාහ. වැළහින්න වුවත් මවක්, බලා සිටීමට නොහැකි තැන වුට්ටාට සැනසිල්ලක් ලබා දී ඇගේ පැටියා රැගෙන ගියා ය. නතර වී සිටි ස්ථානයේ ගස උඩින් තම පැටියා තැබුවා ය. ආපසු ආ වැළහින්න වුට්ටාගේ ඔළුවට පැන්නේ ය. ගස් උඩ සිටි පුතා අම්මාගේ හපන්කම් ගැන ආඩම්බර විය. කැලි කැලිවලට ඉරා දැමීමට සූදානම් වූ විට, ''බුදු මලේ මං ඉවරයි. අනේ මං.'' වුට්ටා මහත් හයියෙන් කෑගැසුවේ ය. පොරෝ කෙටියක් රැගෙන ආ ධර්මේ දැතේ වෙර යොදා ගැසූ පහරින් විලාප නඟා වැළහින්න බිම දිගා විය. වලස් පුතා ගසෙන් බැස මවට ළං විය. එතනින් වව්නියාවටත්, අනුරාධපුරයටත් ගෙන ආ වුට්ටේ සනීප විය.

## කෝල්මුර කවි

වන්නි බංඩාර දෙවියන් සහිත කෝල්මුර ද දක්නට ලැබේ. එමගින් වන්නි දෙවියන් සතු තේජෝ බල පරාක්‍රමය ද මැනවින් විදහා දැක්වේ.

" තෙද ඇති වන්නිය රට උප දින්නේ
බල ඇති යකු බැඳලා බැට දෙන්නේ
රුව ඇති චාමර පලිහ වඩන්නේ
තෙද ඇති වන්නියේ රජුනි වඩන්නේ" (වන්දන ඔරුක්මාන්කුලමේ, 1997, පි. 104).

වන්නියේ දෙවිඳුන්ට පුද සත්කාර නිසි ආකාර ව ඉටු නොවුණොත් දැඩි දඬුවම් පමුණු වන බව මෙයින් විද්‍යමාන වේ. අධ්‍යාපනය සම්බන්ධයෙන් වැදගත් කාරණාවක් ලෙස ද දැක්විය හැකි ය.

" වන්නි මැදට දෙවි වැඩම කරන්නේ
වන්නිය ඇයි පිහිටක් නොම වෙන්නේ
හෙන්ඩු මුණේ දී ඇතු නවතන්නේ
වන්නිය බණ්ඩාර බුදුන් දකින්නේ" (වන්දන ඔරුක්මාන්කුලමේ,1997;104).

මෙහි දී ද වන්නි දෙවියන් සතු සුවිශේෂී ගුණ, ශක්ති නිරූපණය දක්වා තිබෙන අතර උක්ත කරුණුවලට අනුව කුංචුට්ටු කෝරළය මහා වනයට අධිපති ලෙස සැලකෙන අතර බෞද්ධයන් විශාල ප්‍රමාණයක් ජීවත් වන මෙම ජනතාව අතර මුල් බැස ගත් වඩාත් පුද ලබන දේව සංකල්පයක් ලෙස සිංහල ජනශ්‍රැති තොරතුරු මගින් විවරණය වේ.

## මූලාශ්‍රය

• සම්මුඛ සාකච්ඡා මත සිදු කළ ජනශ්‍රැති පර්යේෂණයකි

- රත්නපාල නන්දසේන. **ජනශ්‍රැති විද්‍යා**. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- වන්දන ඔරුක්මාන්කුලමෙ. (1997). රත්මලාන: හුරුළු මංගල්‍යය, තුසිත.
- වන්දන ඔරුක්මාන්කුලමේ. (1990). රත්මලාන: හේන, පෙතිකඩ.
- වන්දන ඔරුක්මාන්කුලමෙ. (1992). **නුවරකලාවියේ නිමිති ජනශ්‍රැති පර්යේෂණය**, රත්මලාන: පෙතිකඩ.
- දිසානායක මුදියන්සේ (1996). **වන්නියේ දෙවි දේවතා සම්භවය සහ ව්‍යාප්තිය**. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- ධර්මදාස කේ. එන්. ඕ. හා තුන් දෙණිය එච්. එම්. එස්. **සිංහල දේව පුරාණය**. කොළඹ: රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.
- ධම්මානන්ද, වත්තේවැවේ. (2013). **මහකැළේයාම**. අනුරාධපුර: වන්නි ප්‍රකාශන.
- නෙවිල් හ්‍යු. (1887). කොළඹ: තැප්‍රොබේන්.

ඉෂාරා තරංගනී අමරසිංහ
සිංහල ශාස්ත්‍රවේදී (ගෞරව)තෙවන වසර
කැලණිය විශ්වවිද්‍යාලය.
isharatharananinewpvt@gmail.com

9 772950 655005